**කොළඹ මහා නගර සභාව.**

**කොළඹ දිස්ත්‍රික්කය**

**1. මුල්‍ය ප්‍රකාශන**

----------------

**1.1 මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම**

2018 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබු අතර එම මුල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ජුලි 29 දින සභාවට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මුල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට කොළඹ මහා නගර සභාවේ මුල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්ම වලට අනුකුලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වු මතය වේ.

**1.3 තත්වාගණනය කළ මතය සඳහා පදනම**

------------------------------------------

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වෙළඳ දැන්වීම් හා දැන්වීම් පුවරු සඳහා රිසිට් පත්‍ර අනුව ආදායම රු.23,057,954 ක් වුවත් මූල්‍ය ප්‍රකාශන වල එය රු.35,315,519 ක් ලෙස සටහන් කිරීමෙන් එකී ආදායම රු.12,257,565 කින් වැඩියෙන් දක්වා තිබුණි. | රිසිට්පත් අනුව අයකල ආදායම ගිණුම්ගත කල යුතුවේ. | පරිගණක ගත තොරතුරු අනුව වෙළඳ දැන්වීම් හා දැන්වීම් පුවරු ආදායම රු.35,315,519 ක් වේ. |
| (ආ) සමාලෝචිත වර්ෂය සඳහා බැංකු අයිරා පොලිය රු.50,066,731 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල එය රු.44,396,646 ක් ලෙස සටහන් කිරීමෙන් එකී වියදම රු.5,670,085 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව ගිණුම් තැබීම සිදුකල යුත්තේ උපචිත පදනම අනුවය. ඒ අනුව ගනුදෙනු හා සිද්ධින් ගිණුම්කරණයේදි වාර්තා කිරිම හා හඳුනා ගැනිම මුල්‍ය ප්‍රකාශන වල ඒවා සිදුවන කාලපරිච්ඡේදය තුල සිදුකල යුතු වේ. | බැංකු ප්‍රකාශනයේ දැක්වෙන බැංකු අයිරා පොලී මුදල ගිණුම්ගත වන්නේ ඊළඟට එළඹෙන මාසයේදීය. ඒ අනුව 2018 දෙසැම්බර් මස ගෙවීම 2019 වර්ෂයේදී ගිණුම්ගත කර තිබේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ලැබිය යුතු සහික දීමනා රු.10,325,063 ක් වුවත් ණයගැතියන් යටතේ එය රු.15,095,063 ක් ලෙස සටහන් කිරීමෙන් ලැබිය යුතු සහික දීමනා රු.4,770,000 කින් වැඩියෙන් දක්වා තිබුණි. | 2018 වර්ෂය සඳහා සහික දීමනා මුදල රු.22,200,063 ක් වන අතර 2018 වර්ෂයේදි රු.11,875,000 ක් හා 2019 ජනවාරි මස ර.10,320.063 ක් ප්‍රතිපූර්ණය කර එවා තිබුණි. මේ අනුව 2018 වර්ෂය සඳහා ලැබිය යුතු සහික දිමනා මුදල රු.10,325.063 කි. ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව ගිණුම් තැබීම සිදුකල යුත්තේ උපචිත පදනම අනුවය. ඒ අනුව ගණුදෙනු හා සිද්ධින් ගිණුම්කරණයේදි වාර්තා කිරීම හා හඳුනා ගැනීම මූල්‍ය ප්‍රකාශන වල ඒවා සිදුවන කාලපරිච්ඡේදය තුල සිදුකල යුතුවේ. | 2018 වර්ෂයට අදාලව ප්‍රතිපූර්ණය සඳහා යවන ලද සහික දීමනා මුදල රු.22,220,063 ක් වන අතර 2018 දෙසැම්බර් 31 දින වන විට ප්‍රතිපූර්ණය කර එවා ඇති මුදල රු.7,125,000.00 කි. ඒ අනුව 2018 දෙසැම්බර් 31 වන විට ලැබිය යුතු මුදල රු.15,095,063 කි. |
| (ඈ) | ආසියානු සංවර්ධන බැංකු ණය සඳහා පොලිය වෙනුවෙන් ණයහිමි වෙන් කිරීම රු.56,085,230 ක් වුවත් ණය අංක: 3348 හා 3349 සඳහා 2018 මැයි 16 සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා පොලිය ගෙවීමට ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කල යුතුවේ. | ණය අංක 3348/ 3349 සඳහා ණයහිමි වෙන් කිරීම රු.56,085,230 ක් ලෙස විගණනයෙන් පෙන්වා දීම නිවැරදි වේ. |

**1.3.2 නොසැසඳුනු ගිණුම්**

--------------------

| <u>විගණන නිරීක්ෂණය</u> | <u>නිර්දේශය</u> | <u>ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම</u> |
|---|---|---|
| ගිණුම් විෂයයන් 31 ට අදාලව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම් හා ඊට අදාල උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.360,089,515 ක වෙනසක් නිරීක්ෂණය වු අතර එකී වෙනස්කම් වලට හේතු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | අදාල ශේෂ වල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කල යුතුවේ. | ලේඛන වල ඇතුලත් කිරීමේ අඩුපාඩු හේතුවෙන් වෙනස්කම් ඇති වී ඇත. |

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීයාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ)** වර්ෂ 18 කට පෙර සිට පැවත එන රු.11,287,600 ක්වූ ලැබිය යුතු ගිණුම් 23 ක ශේෂයන් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අය කර ගැනිමට කටයුතු කල යුතුවේ. | මෙම ශේෂ කපා හැරීම හෝ ගිණුම් නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින අතර ඉක්මනින් මෙම ශේෂ විස්තර සොයාගෙන නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| **(ආ)** වර්ෂ ගණනාවක සිට අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් නිලධාරීන් වෙත ලබා දී ඇති සුළු මුදල් හා විශේෂ අත්තිකාරම් ගිණුම්වල නිරවුල් නොවූ රු.3,185,604 ක ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනිමට කටයුතු කල යුතුවේ. | මෙම මුදල පිළිබඳව විස්තරාත්මක තොරතුරු සොයාගැනීමට නොහැකි වී ඇත. මේ වන විට එම ශේෂය රු.3,185,604 ක් දක්වා අඩු වී ඇත. තවදුරටත් පරික්ෂා කරමින් පවතී. |
| **(ඇ)** සභාවට ලැබිය යුතු ණයගැති ශේෂ තුළ අක්‍රීය ගිණුම් 3006 කට අදාලව රු.410,084,815 ක වටිනාකමක් විය. | ලැබිය යුතු ශේෂ අයකර ගැනිමට කටයුතු කල යුතුවේ. | මෙම ශේෂ අයකර ගැනීමට නොහැකි බැවින් ඉවත් කිරීම සඳහා කටයුතු කරමින් පවතී. |
| **(ඈ)** වසර 18 කට පමණ පෙර සිට පැවත එන ගෙවියයුතු තැන්පත් රු.99,848,922 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කල යුතුවේ. | 2001 වර්ෂයට පෙර සිට පැවත එන ශේෂයක් වන අතර 2001 වර්ෂයට පෙර කොළඹ මහා නගර සභාවේ ඇප තැම්පතු තිබිය යුතු සේවාවන් වලට අයත් තනතුරු සඳහා ඇප මෙම ගිණුමේ පවතී. එම කාර්ය මණ්ඩල විශ්‍රාම ගන්නා අවස්ථාවේදී පමණක් නිරවුල් කල හැකිය. |
| **(ඉ)** දේශිය ආදායම් බදු පනත යටතේ එකතු කරන ලද රු.20,765,810 ක බදු මුදල් දේශිය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය නොකර ගෙවිය යුතු තැන්පත් ගිණුමේ දක්වා තිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරින් සමඟ සාකච්ඡා කර නිවැරදි කල යුතු ආකාරය පිළිබඳ ඔවුන්ගේ උපදෙස් අනුව ක්‍රියාකර මෙම තත්වය නිවැරදි කිරීමට කටයුතු කරන බවට කාරුණිකව දන්වමි. |

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම.**

---

| විගණන නිරීක්ෂණය | නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීයාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.2,129,338,446 ක් වු ගිණුම් විෂයයන් 04 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය/ සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතුවේ. | නිරවුල් කිරීමට කටයුතු කරමි. |

**1.4 අනුකූල නොවීම්.**

---

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.**

---

| විගණන නිරීක්ෂණය | | | | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීයාගේඅදහස් දැක්වීම |
| --- | --- | --- | --- | --- | --- |
| | නීති රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | | |
| **(අ)** | මහා නගර සහා ආඥා පනතේ 261 වගන්තිය | රු.214,628,002 | වරිපනම් බදු නොගෙවීම නිසා විකුණන ලද ඉඩම් මිලට ගැනීමට සභාවට ඇති බලය ක්‍රියාත්මක කර නොතිබුණි. | වරිපනම් බදු නොගෙවීම නිසා විකුණන ලද ඉඩම් මිලට ගැනීමට සභාවට ඇති බලය ක්‍රියාත්මක කල යුතුවේ. | වරිපනම් බදු නොගෙවීම මත හිඟ වරිපනම් මුදල අයකර ගැනීම සඳහා නගර සභා ආඥා පනත අනුව තහනමට ගනු ලබන දේපල සඳහා එම දේපළවල අවසන් වරට හිමිකම් කියනු ලබන ඔප්පු සහතික හා පිඹුරුපත් සොයා ගැනීමට නොහැකි වීම නිසා විකිණීම් සහතික ලිවීමට ප්‍රමාද වී ඇත. |
| | | | | පොරොත්තු ලේඛණයක ඇතුලත් කර ඒ අනුව වර්ග කල නිල නිවාස වෙන්කර දීමට කටයුතු කල යුතුවේ. | පිළිතුරු ඉදිරියේදී ලබා දීමට කටයුතු කරමි. |
| **(ආ)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය XIX වන පරිච්ඡේදය | - | නිවාස වර්ගීකරණය කර ඒ අනුව පොරොත්තු ලේඛනයට, ඉල්ලුම්කරුව න්ගේ නම් ඇතුලත් කර එම අනුපිළිවෙල අනුව නිවාස වෙන්කර දීමට කටයුතු කර නොතිබුණි. | සුළු මුදල් අග්‍රිම අදාල වර්ෂය තුලදිම පියවීමට කටයුතු කල යුතුවේ. | පරිගණක ගිණුම්කරණ පද්ධතිය ආරම්භයේදී 2001 වර්ෂය අවසානයට නොපියවූ අත්තිකාරමේ ශේෂයෙන් හඳුනාගෙන පියවා නොමැති ශේෂය රු. 3,185,603 ක් වන අතර මෙම ගණුදෙනු හඳුනාගත නොහැකි වීම මත නිරවුල් නොවී මේ දක්වා ඉදිරියට පැමිණි ශේෂයකි. |

| | | | | |
|---|---|---|---|---|
| **(ඇ)** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ **(i)**මු.රෙ.371 (6) | රු.3,185,604 | සුළු මුදල් අග්‍රිම අදාල මුදල් වර්ෂය තුලදීම පියවීමට කටයුතුකර නොතිබුණි. | නිකුත් කල එහෙත් එකතුවට ඉදිරිපත් නොකල මාස 06 ඉක්මවූ චෙක්පත් මුදල් රෙගුලාසි ප්‍රකාර නිරවුල් කිරීමට කටයුතු කල යුතුවේ. | 2019 අප්‍රේල් 30 දිනට මාස 06 ඉක්මවූ රු.11,901,074 ක චෙක්පත් අදාල වන්නේ ගෙවීම් ගිණුම් 03 සඳහාය. මෙම චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරනු ලැබේ. |
| **(ii)** මු.රෙ.396 (ඇ) | රු.11,901,074 | නිකුත් කල ගෙවීම සඳහා ඉදිරිපත් නොකල මාස 06 කට වැඩි කාලයක් ඉක්මවූ චෙක්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් කල යුතුවේ. | පිළිතුරු ඉදිරියේදී ලබා දීමට කටයුතු කරමි. |
| **(iii)** මු.රෙ.1646 | - | දිසා කාර්යාල 04 හි දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අනුමත කල හඳුනාගත් ව්‍යාපෘතින් ක්‍රියාත්මක කල යුතුවේ. | මේ වන විට නාගරික සංවර්ධන අධිකාරි ගිණුමේ ඇති මුදලින් ව්‍යාපෘති කිහිපයක් සැලසුම්කර ඇති අතර ඉදිරියේදී ඒ සම්බන්ධයෙන් නිසි අනුමැතිය ලබාගෙන ක්‍රියාත්මක කිරීමට නියමිත බව කාරුණිකව දැනුම් දෙමි. |
| **(ඈ)** 1987.09.20 දිනැති අංක 08 දරන නාගරික සංවර්ධන අධිකාරියේ චක්‍රලේඛය | රු.752,787,502 | ගිණුමේ තිබු මුදල් වලින් හඳුනාගත් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | | |

**2. මුල්‍ය සමාලෝචනය**

**2.1 මුල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයසඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,312,992,879 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,382,289,817 ක් විය.

**2.2 මුල්‍ය පාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ජංගම ගිණුම් 02 කට අදාල රු. 24,080,596 ක්වූ සෘජු බැර කිරීම් හා සාවද්‍ය බැර කිරීම්, ජංගම ගිණුම් 5 කට අදාල රු.14,760,003 ක්වූ සෘජු හර කිරීම් හා සාවද්‍ය හර කිරීම්ද හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | සෘජු බැර කිරීම් හා සාවද්‍ය බැර කිරීම් ද, සෘජු හර කිරීම් හා සාවද්‍ය හර කිරීම්ද හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කල යුතුවේ. | මෙම සෘජු හර කිරීම් හා සෘජු බැර කිරීම් හඳුනා ගෙන නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. |
| (ආ) ජංගම ගිණුම් 04 ක තැන්පත් කරන ලද වර්ෂ 01 සිට 03 ක කාලයක් ඉක්මවා තිබූ රු.3,061,800 ක් වූ උපලබ්ධි නොවූ චෙක්පත් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | උප ලබ්ධි නොවූ චෙක්පත් නිරවුල් කිරීමට කටයුතු කල යුතුවේ. | තැන්පත් කල උපලබ්ධි නොවූ චෙක්පත් සම්බන්ධයෙන් අදාල අංශ දැනුවත් කර ඇති අතර ඉදිරියේදී එම ආදායම් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිත බව කාරුණිකව දන්වමි. |

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) වරිපනම්** | | |
| (i) 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ වරිපනම් රු.3,203,546,484 ක් වූ අතර එයින් රු.500,000 ඉක්ම වූ දේපළ 753 කට අදාළ හිඟ වරිපනම් වටිනාකම රු.1,507,225,518 ක් විය. එය මුළු හිඟයෙන් සියයට 47 ක ප්‍රතිශතයකි. | රු.500,000 ඉක්මවූ දේපල 753 ක් සම්බන්ධයෙන් තවදුරටත් අයවීමට ඇති හිඟ වරිපනම් අයකර ගැනීමට හා තවදුරටත් අයනොවන දේපල සඳහා ආඥා පනත අනුව කටයුතු කල යුතුවේ. | හිඟ අයකර ගැනීම සඳහා ආදායම් පරීක්ෂක මහතුන් හට වරෙන්තු ලබා දී ඇති අතර තවදුරටත් අය නොවන දේපළ සඳහා වෙන්දේසි ක්‍රියා මාර්ග අනුගමනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |
| (ii) රු.500,000 ට වැඩි හිඟ වරිපනම් බදු දේපල අතරින් රජයේ දේපළ 188 ක මුළු හිඟ වරිපනම් බදු මුදල රු.527,578,658 ක් විය. මෙය රු.500,000 ට වැඩි හිඟ බදු දේපල ප්‍රමාණයෙන් සියයට 35 ක් වන අතර මුළු හිඟ වරිපනම් බදු ආදායමෙන් සියයට 16 කි. | හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | හිඟ මුදල් අයකර ගැනීමට හා කපා හැරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

| | | |
|---|---|---|
| **(iii)** රු.500,000 ට වැඩි හිඟ ශේෂයන් පවතින දේපළ අතරින් 2018 වර්ෂය තුලදී කිසිදු වරිපනම් මුදලක් නොගෙවූ දේපළ 483 ක්වූ අතර එහි මුළු හිඟ මුදල් ප්‍රමාණය රු.1,062,303,345 ක් විය. | හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | හිඟ මුදල් අයකර ගැනීමට හා කපා හැරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවති. |
| **(iv)** සභාව තුල දැනට පවත්නා තොරතුරු තාක්ෂණ මෙහෙයුම් පද්ධතිය (AS400) තුළ තක්සේරුකරණය සම්බන්ධව විෂය ක්ෂේත්‍රය අන්තර්ගත වී තිබුණද එම ක්ෂේත්‍රය යාවත්කාලීන කිරීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | තොරතුරු තාක්ෂණ මෙහෙයුම් පද්ධතිය තුල තක්සේරුකරණය සම්බන්ධව විෂය ක්ෂේත්‍රය යාවත්කාලීන කිරීමට කටයුතු කල යුතුවේ. | ඉදිරියේදි මෙය ගිණුම්කරණ පරිගණක පද්ධතිය හා සම්බන්ධ කර තක්සේරුකරණ කටයුතු යාවත්කාලීන කිරීමට කටයුතු සිදුකරමින් පවති. |
| **(v)** රු.10,000,000 ට වැඩි වරිපනම් බදු ගෙවන්නන් සංඛ්‍යාව 25 ක් වූ අතර එයින් 19 දෙනෙකු වර්ෂය තුලදී කිසිදු බදු මුදලක් ගෙවා නොතිබුණි. එහි මුළු හිඟ වරිපනම් බදු මුදල රු.349,501,700 ක් විය. | හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | හිඟ අයකර ගැනීමට කටයුතු කරමින් පවති. |
| **(ආ) වෙළඳ බදු හා ව්‍යාපාර බදු**<br>------------------------------ | | ඉදිරියේදි ආදායම් අයකර ගැනීම් වැඩි කිරීමට ක්‍රියාකරමි. |
| **(i)** සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපාර හා වෙළඳ බදු වශයෙන් රු.65,000,000 ක් ඇස්තමේන්තු කර තිබූ අතර එයින් වර්ෂය තුල අයවී තිබුණේ රු.13,295,000 ක් පමණි. ඒ අනුව ගිණුමෙහි පෙන්වා තිබූ රු.34,523,750 කින් රු.21,228,750 ක් 2018 වර්ෂයට අදාල නොවූ අතර වර්ෂයට අදාල මුළු ආදායමෙන් අවසාන ගිණුම තුලින් පිළිබිඹු වුයේ සියයට 38 ක් පමණි. | වර්ෂයට අදාල ව්‍යාපාර හා වෙළඳ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | |
| **(ii)** බස්නාහිර පළාත් පාලන දෙපාර්තමේන්තුවේ 1996 ඔක්තෝබර් 01 දිනැති අංක 39/96 දරන චක්‍රලේඛය මගින් වර්ෂයට අදාල බදු මුදල් එම වර්ෂය තුලදීම එකතු කර ගැනීමට එවායේ පරිපාලන ප්‍රධානින් කටයුතු කළයුතු බව දක්වා තිබුණත් කොළඹ මහා නගර සභාව විසින් ව්‍යාපාර බදු සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | බදු මුදල් කාර්යක්ෂමව එකතු කර ගැනීමට කටයුතු කල යුතුවේ. | ඉදිරියේදි ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |
| **(ඇ) විනෝද බදු**<br>------------- | | |
| කොළඹ මහා නගර සභා බල ප්‍රදේශය තුල 2018 වර්ෂය තුලදී පැවැත්වූ ප්‍රසංග, සංගීත සංදර්ශන හා ක්‍රීඩා තරඟ සඳහා අයකල විනෝද බදු මුදල රු.128,911,243 ක්වූ අතර බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය මත රු.27,571,533 ක විනෝද බදු නිදහස් කර තිබුණි. නිදහස් කල බදු මුදල ප්‍රතිශතයක් ලෙස සියයට 21 ක් විය. | බදු නිදහස් මුදල් ප්‍රජා සත්කාර කටයුතු සඳහා යොදාගත් බවට වූ සහතික ඉදිරිපත් කළ යුතුවේ. | බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍යතුමා විසින් එතුමාට පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 වර්ෂය තුල රු.27,571,533 ක මුදලක් විනෝද බද්දෙන් නිදහස් කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇත. |

**2.3.2 කුලී**

-----

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීයාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) නිවාස කුලී**<br>නිවාස සංකීර්ණ වලින් සභාවට අයවිය යුතු හිග කුලිය 2018 දෙසැම්බර් 31 දිනට රු.10,554,133 ක් විය. මෙම නිවාස සංකීර්ණවල සැලකිය යුතු නිවාස ප්‍රමාණයක දීර්ඝ කාලයක සිට කුලී අය නොවී තිබූ අතර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. මෙම හිඟහිට ඇති නිවාස ප්‍රමාණයෙන් අඩකට වැඩි නිවාස ප්‍රමාණයක වර්ෂ 10 ඉක්මවා මාසික කුලි මුදල් හිඟහිට තිබුණි. | හිඟ කුලි අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ කුලි අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| **(ආ) පදික කඩ කුලි**<br>---------------<br>**(i)** 2018 දෙසැම්බර් 31 දිනට සභාවට අයවිය යුතු පදික කඩ කුලි මුදල රු.431,604,720 ක් වූ අතර ඒ තුල රු.112,243,332 ක අක්‍රිය පදික කඩ කුලියක්ද ඇතුලත්වී තිබුණි. ඒ අනුව ලැබිය යුතු මුළු පදික කඩ කුලියෙන් සියයට 30 ක් අයකර ගැනීම අවිනිශ්චිත විය. | හිඟ කඩකුලි අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | අවශ්‍ය සාක්ෂි හා තොරතුරු ලබා ගෙන මෙම හිඟ මුදල් සම්බන්ධයෙන් ඉතා ඉක්මනින් කටයුතු කරන බව දන්වමි. |
| **(ii)** 2018 වර්ෂය තුල බිල් කල පදික කඩ කුලී රු.114,624,141 ක් වුවද රු.431,604,720 ක හිඟ පදික කඩ කුලීයක් තිබීම තුල ආදායම් අංශයේ කඩකුලී අයකර ගැනීමේ අවිධිමත් හා අකාර්යක්ෂම බව නිරීක්ෂණය විය. | හිඟ පදික කඩකුලි අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | පදික කඩ කුලි අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගනිමි. |

**2.4 අධිභාර**

--------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීයාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවළුන්ට එරෙහිව විගණකාධිපති විසින් නිකුත් කර තිබූ අධිභාර සහතිකයක් වෙනුවෙන් 2019 ජනවාරි 31 දිනට රු.61,135 ක් අයවිය යුතුව තිබුණි. | තවදුරටත් අයවිය යුතු රු.61,135 ක මුදල අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | අයකර ගැනිමට කටයුතු කරමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1 කාර්යසාධනය**

----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීයාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) අතුරු ව්‍යවස්ථා**<br>මහා නගර සභා ආඥා පනතේ 272 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා ඉටු කිරීම සඳහා අතුරු | කර්මාන්ත, අපද්‍රව්‍ය විධිමත් කිරීම හා පාලනය | අදාල අතුරු ව්‍යවස්ථා |

| | | | |
|---|---|---|---|
| | ව්‍යවස්ථා පැනවිය යුතු වන නමුත් කර්මාන්ත, අපද්‍රව්‍ය විධිමත් කිරීම හා පාලනය සම්බන්ධව අතුරු ව්‍යවස්ථාවන් පනවා නොතිබුණි. | සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථ පැනවීමට කටයුතු කල යුතුවේ. | නීති අංශයට යොමු කර ඇත. |
| **(ආ)** | <u>**ක්‍රියාකාරී සැලැස්ම**</u><br>සියළුම දෙපාර්තමේන්තු ආවරණය වන පරිදි 2018 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | සභාව විසින් එක් එක් දෙපාර්තමේන්තු විසින් ඉටු කරනු ලබන කාර්යයන් ඇතුලත් කර ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කල යුතුවේ. | පිළිතුරු ඉදිරියේදී ලබා දීමට කටයුතු කරමි. |
| **(ඇ)** | <u>**කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්**</u><br>2018 වර්ෂයේ කර්මාන්ත ලේඛණය විගණනය සඳහා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් වැඩ අවසන් නොකල කර්මාන්ත ගණන හා ගෙවීම් වටිනාකම හඳුනාගැනීමට නොහැකිවිය. | කර්මාන්ත ලේඛණයක් ඉදිරිපත් කල යුතුවේ. | පිළිතුරු ඉදිරියේදී ලබා දීමට කටයුතු කරමි. |
| **(ඇ)** | <u>**ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**</u> | | |
| **(i)** | ඝණ අපද්‍රව්‍ය කළමණාකරනය සඳහා සභා ආදායමෙන් සියයට 39 ක් වැය කර තිබීමෙන් මහා නගර සභා ආඥා පනතේ 130 වගන්තිය ප්‍රකාරව මහා නගරය තුළ එකතු කරනු ලබන කසල, සභාවේ දේපලක් බවට පත් කර ගැනීමට කටයුතු නොකිරීමෙන් සභාවට වැය බරක් පමණක් වී තිබුණි. | මහා නගර සභා ආඥා පනතේ 130 වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | කොළඹ නගරයේ එක්රැස් වන කසළ කළමනාකරණය කිරීමේදී එහි නිසි වටිනාකම ලබා ගැනීම සඳහා එම කසළ සම්පතක් ලෙස හඳුනා ගැනීමත් ඒ අනුව එය නිසි ප්‍රතිචක්‍රීකරණයක් සඳහා යොමු කිරීමත් ඊට අවශ්‍ය පහසුකම් ප්‍රවර්ධනය කිරීමත් ජනතාව දැනුවත් කිරීමත් කොළඹ මහා නගර සභාව විසින් දීර්ඝ කාලීනව ඉටු කරනු ලබයි. |
| **(ii)** | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ඉඩමක් මිලදී ගැනීමට 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා එකතුව රු.මි.130 ක් ප්‍රතිපාදන සලසාගෙන තිබුනත් ඒ අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කර නොතිබුණි. 2019 අගෝස්තු මස සිට කෙරවලපිටිය කසළ අංගනයට ඝණ අපද්‍රව්‍ය භාර ගැනීම ප්‍රතික්ෂේප කර තිබීම නිසා සභා බල ප්‍රදේශයේ කසළ එකතු කිරීම හා බැහැර කිරීමේ කටයුතු ගැටළුකාරී තත්ත්වයට පත්ව ඇත. | ඝණ අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගැටළු විසඳීම සඳහා සභාව විසින් කෙටිකාලීන හා දිගුකාලීන වැඩසටහන් සකස් කිරීම කළ යුතු වේ. | කසළ කළමනාකරණ කටයුතු සඳහා මධ්‍යම රජයේද සහයෝගය ඇතිව දීර්ඝ කාලීන විසඳුමක් ලෙස කෙරවලපිටිය Waste to Energy ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන බැවින් කොළඹ මහා නගර සභාව සඳහා ඉඩමක් මිලදී ගැනීම තවදුරටත් අවශ්‍ය නොවේ. |

| | | | |
|---|---|---|---|
| **(iii)** | මහා නගර සභාව විසින් කසළ එකතු කිරීම, ප්‍රවාහනය, ප්‍රතිචක්‍රීකරණය සහ බැහැර කිරීම යන කාර්යයන් ඉටු කරනු ලැබුවද 2008 පෙබරවාරි 21 දිනැති අංක 1534/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ නියෝග ප්‍රකාරව පරිසර ආරක්ෂණ බල පත්‍රයක් ලබාගෙන නොතිබුණි. | කසළ එකතු කිරීම, බැහැර කිරීම සිදුකරනු ලබන බැවින් පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගත යුතුවේ. | මහා නගර සභා ආඥා පනතට අනුව කොළඹ මහා නගර සභාව සීමාව තුළ කසළ එකතු කිරීම කොළඹ මහා නගර සභාවේ මූලික වගකීමක් වන හෙයින් ද කොළඹ මහා නගර සභාව රාජ්‍ය ආයතනයක් වන හෙයින් ද කසළ එකතු කිරීම ප්‍රවාහන ප්‍රතිචක්‍රීකරණ හා බැහැර කිරීම යන කාර්යයන් ඉටු කිරීම සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගැනීමේ අවශ්‍යතාවයක් ඇති නොවීය. |

**(ඉ)** <u>පාරිසරික ගැටළු</u>

| | | | |
|---|---|---|---|
| **(i)** | විශාල පරිසර හානියක් සිදුකරන විද්‍යුත් අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ලියාපදිංචි වී ඇති විද්‍යුත් අපද්‍රව්‍ය එක්රැස් කරන ආයතන සමඟ ඒකාබද්ධව ක්‍රමවේදයක් සකස් කිරීම කළ යුතුවේ. | කොළඹ මහා නගර සභාව විසින් අදාල විද්‍යුත් කසළ එකතු කිරීමේ ක්‍රමවේදයක් ඇති කිරීමට පියවර ගත්ත ද ඊට අදාල නිසි අවසන් විසඳුමක් නොමැති වීම ඉදිරි කටයුතු සඳහා විශාල බාධාවක් වේ. |
| **(ii)** | කසළ ජනනය අඩු කිරීම, කසළ නැවත භාවිතයට ගැනීමේ ක්‍රමවේද හඳුන්වා දීම හා ප්‍රතිචක්‍රීකරණය සඳහා විධිමත් හා කඩිනම් වැඩ පිළිවෙලක් පිළිබඳව ප්‍රමාණවත් පරිදි අවධානය යොමු නොකර ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට අයත් භූමියකට කසළ බැහැර කිරීම සිදු කරමින් තිබුණි. | කසළ බැහැර කිරීමේ ගැටළු විසඳීම සඳහා සභාව කඩිනමින් කෙටි කාලින හා දිගු කාලින වැඩසටහන් සකස් කිරීම ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම කල යුතුවේ. | නවීන තාක්ෂණික ක්‍රම උපයෝගි කරගෙන ඝණ අපද්‍රව්‍ය එකතු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමි. |

**(ඊ)** <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

| | | |
|---|---|---|
| කොළඹ මහා නගර සභාව තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 පිළිබඳව දැනුවත් වී නොමැති අතර 2018 ජුලි 31 දින වන විටත් තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගෙන නොතිබුණි. | තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගැනීමට කටයුතු කල යුතුවේ. | පිළිතුරු ඉක්මනින් ලබා දීමට කටයුතු කරමි. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ)** 2016 වර්ෂයෙන් පසු හිඟ හිටි දේපල පවරා ගැනිමට 2017 ජුනි 21 දින පුවත්පත් දැන්වීමක් පලකර තිබු නමුත් 2019 පෙබරවාරි 25 දක්වාම අවශ්‍ය කටයුතු ඉටු කර නොතිබුණි. | හිඟ වරිපනම් දේපල පවරා ගැනීමට කටයුතු කල යුතුවේ. | එම දැන්වීමෙන් පසු තවදුරටත් ගෙවීම් සිදු නොකරනු ලබන දේපළ පවරාගැනීමට කටයුතු කරන අතර එසේ පවරා ගැනීමට ගැසට් කිරීමද සිදු කල යුතුවේ. සංශෝධිත ලැයිස්තුව සකස් කිරීම සිදු කරන ලද නමුත් පළාත් පාලන ආයතන ඡන්දය 2018 ජනවාරි මස පැවැත්වූ බැවින් නව සභාව වැඩ භාරගන්නා තෙක් ප්‍රමාද කිරීමට සිදු විය. 2017.12.31 දිනට රු.500,000 ට වැඩි ශේෂය පදනම් කරගෙන 2019 වසරේදී වෙන්දේසි කිරීමට පියවර ගනිමින් පවතින බව සදහන් කරමි. |
| **(ආ)** සභාව විසින් විකුණුම් සහතික ලිවීම සඳහා 2003 සිට 2016 දක්වා හඳුනාගෙන තිබු රු.214,628,001 ක හිඟ ගෙවීම් තිබු දේපල 193 පිළිබඳව සභාව තුල ප්‍රමාණවත් සාක්ෂි නොතිබිම නිසා දේපල පවරා ගැනිමේ කටයුතු කිරීමට නොහැකි තත්ත්වයක් නිර්මාණය වි තිබුණි. | හිඟ වරිපනම් දේපලෙ පවරා ගැනීමට කටයුතු කල යුතුවේ. | වර්තමාන තත්වය හා කවරෙක් විසින් බුක්ති විදිනු ලබන්නේද පිළිබඳ තොරතුරු ආදායම් පරීක්ෂක නිලධාරින්ගෙන් කැඳවා ඇත. හිඟ නොගෙවීම මත තහනමට ගනු ලබන දේපලවල හිමිකම් ඔප්පුව සහ පිඹුර සොයාගැනීමට නොහැකි වී ඇති අතර එම තොරතුරු සොයාගැනීමට වෙනත් විකල්ප මාර්ගයන්ද නොමැති නිසා විකුණුම් සහතික ලිවීම ප්‍රමාද වී ඇත. |
| **(ඇ)** සභාව විසින් 2007 වර්ෂයට පසු හිඟ වරිපනම් දේපල පිළිබඳ ගැසට් නිවේදනයක් නිකුත්කර තිබුනේ 2014 වර්ෂයේදීය. | හිඟ වරිපනම් සම්බන්ධයෙන් ආඥා පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාර කටයුතු කල යුතුවේ. | 2007 හා 2014 වර්ෂ ඇතුලත දේපල තහනමට ගැනීම සඳහා ගැසට් නිවේදනයක් නිකුත්කර නොමැති නමුත් මහනගර සභා ආඥාපනතේ 252 |

| | | |
|---|---|---|
| | | යටතේ හිඟ වරිපනම් බදු අයකිරීම සඳහා වරෙන්තු බලපත්‍රයක් නිකුත් කර ඇත. එම වරෙන්තු ක්‍රියාත්මක කිරීම නිසා ඇතැම් දේපල සඳහා පැවති හිඟ රැස්කර ගැනීමට හැකි වී ඇත. |
| **(ඇ)** වරිපනම් මුදල් නොගෙවීම මත වරිපනම් අංක 43, බාන්ස් පෙදෙස, කුරුඳුවත්ත යන ලිපිනයෙහි පිහිටි පර්චස් 154.43 වූ ඉඩම 1974 වර්ෂයේදී කොළඹ මහා නගර සභාවට පවරා ගෙන තිබූ නමුත් 2019 අප්‍රේල් මාසය වන විටත් මෙම ඉඩමෙහි භුක්තිය නගර සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබිණි. | ඉඩමෙහි භුක්තිය නගර සභාව වෙත පවරා ගැනීමට කටයුතු කල යුතුවේ. | නගර සභාව විසින් නෙරපීමේ නියෝගය සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් ගොනු කර ඇති අතර මෙම දේපළ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් පවතින බැවින් එම නඩුව විභාගයට ගෙන නොමැත. |

**3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ)** 2018 වර්ෂයේදී අනවසර ඉදිකිරීම් සම්බන්ධ පැමිණිලි 596 ක් ලැබී තිබූ අතර ඉන් 141 ක් සම්පූර්ණයෙන්ම අනවසර ඉදිකිරීම් සහ 214 ක් අර්ධ අනවසර ඉදිකිරීම් විය. ඉතිරි අනවසර ඉදිකිරීම් වලින් 74 ක් සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් කටයුතු කර තිබූ අතර ඉතිරි අනවසර ඉදිකිරීම් 160 අර්ධ හෝ සම්පූර්ණ වශයෙන් වෙන්කර නොතිබුණි. මෙම අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් ඉදිරිපත් වන පැමිණිලි සම්බන්ධයෙන් පමණක් නගර සභාව ක්‍රියාත්මක වී තිබුණි. | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් ඉදිරිපත් වන පැමිණිලි පමණක් නොව සභාව විසින්ද අනවසර ඉදිකිරීම් හඳුනා ගැනීමට කටයුතු කල යුතුවේ. | අනුමත කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කර නොමැති ඉදි කිරීම් සඳහා සිහි කැඳවීම් ලිපි නිකුත් කිරීමට කටයුතු යොදා ඇත. දැනට 2017 වර්ෂයේ සිට ලියාපදිංචි වී ඇති ලිපිගොනු සඳහා සිහි කැඳවීම් ලිපි නිකුත් කිරීම ආරම්භ කර ඇත.තවද 2018 වර්ෂයේ අගෝස්තු මස සිට ආරම්භ කරන ලද සංවර්ධන බලපත්‍ර ක්‍රියාවලිය පරිගණකගත කිරීම මගින් ද පසු විපරම් කිරීම පහසු කර ඇත. |
| **(ආ)** සුදුවැල්ල ප්‍රධාන ගබඩාවේ 2011 වර්ෂයේ සිදුවූ රු.2,102,784 ක් වූ තොග ඌනතාවට වගකිව යුතු එක් නිලධාරියෙකුගෙන් අයවිය යුතු තොග ඌනතාවය අතහැර දැමීමට මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව ගෙන තිබූ තීරණයට බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලැබී | විධිමත් පරීක්ෂණයක් පවත්වා වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගත යුතුවේ. | පිළිතුරු ඉදිරියේදී ලබා දීමට කටයුතු කරමි. |

නොතිබුණි.

| | | | |
|---|---|---|---|
| **(ඇ)** | "GO GREEN COLOMBO" වැඩ සටහන පිළිබඳව 2018 ජූලි 23 දිනැති අභ්‍යන්තර විගණන වාර්තාවේ සඳහන් නිර්දේශ 06 ක් සම්බන්ධයෙන් 2019 මැයි 09 දින වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අභ්‍යන්තර විගණන වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කල යුතුවේ. | පිළිතුරු ඉදිරියේදී ලබා දීමට කටයුතු කරමි. |

**3.4** **මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | නගර සැලසුම් අංශයේ පුරප්පාඩු සංඛ්‍යාව 97 විය. | අදාල පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුය. | නගර සැලසුම් අංශයේ පවතින පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලීම් කර පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කිරීමෙන් පසු පළාත් පාලන කොමසාරිස් විසින් අමාත්‍යාංශ ලේකම්ට දැනුම් ඇත. තාක්ෂණ නිළධාරී තනතුරේ පුරපුපාඩු පිරවීමට ඉල්ලුම් කර ඇත. |
| **(ආ)** | නාගරික තක්සේරු දෙපාර්තමේන්තුවේ තනතුරු 03 ක පුරප්පාඩු 08 ක් පැවතුනි. | අදාල පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුවේ. | තක්සේරු දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් හා ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට පළාත් පාලන කොමසාරිස් වෙත දන්වා ඇත. |
| **(ඇ)** | මහජන ආධාර දෙපාර්තමේන්තුවේ තනතුරු 04 ක පුරප්පාඩු 84 ක් පැවතුනි. | අදාල පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුවේ. | Relief Officer - මෙම තනතුරේ පත්වීම් බලධාරියා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වේ. Pre School Teacher - මෙම තනතුරට බඳවා ගැනීමට අයදුම්පත් කැඳවා ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල මත අභ්‍යන්තර අයදුම්කරුවකුට 2018.09.03 දින සිට පෙර |

| | | | |
|---|---|---|---|
| | | | පාසැල් ගුරු තනතුරට පත්වීම් ලබා දී ඇත. ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල මත බාහිර අයදුම්කරුවන් 23 කට 2019.04.06 දින සිට පෙරපාසැල් ගුරු තනතුර සඳහා පත්වීම් ලබා දී ඇති අතර 2019.06.17 දින සිට දෙදෙනෙකුට පත්වීම් ලබා දී ඇත. Sewing Instructor - මෙම තනතුරට බඳවා ගැනීමට අභ්‍යන්තරව අයදුම්පත් කැඳවා ඇති අතර ඉදිරි මස ඇතුලතදී අභ්‍යන්තර බඳවා ගැනීම් සිදුකිරීමට කටයුතු යොදා ඇත.බාහිරව බඳවා ගැනීමට පුවත්පත් දැන්වීම් සකස් කර ඇත. Attendant - මෙම තනතුරට බඳවා ගැනීමට පුවත්පත් දැන්වීම් සකස් කර ඇත. |
| **(ඇ)** | දිස්ත්‍රික් කාර්යාල 04 හි නිලධාරීන් හා සේවකයින් 99 දෙනෙකු වසර 12 ත් 39 ත් අතර කාල පරාසයක් අභ්‍යන්තර ස්ථාන මාරුවීම් නොලබා දීර්ඝ කාලයක සිට එකම ස්ථානයක සේවය කරමින් පැවතුණි. | ස්ථාන මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කල යුතුවේ. | කොළඹ මහා නගර සභාව සඳහා ස්ථාන මාරු ප්‍රතිපත්තියක් සකස් කර ඇති අතර එය 2020 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරනු ලැබේ. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | | | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| **වත්කම් වර්ගය** | **වටිනාකම රු.** | **නිෂ්ක්‍රීය පවතින කාලය** | | |
| **අ)** කළු ගල් ½ මිටර් කියුබ් 3500 | - | අවු.01 | ඉදිරියේදී කාර්යක්ෂමව අමු ද්‍රව්‍ය මිලදී ගැනීමට ක්‍රියා කළ යුතුවේ. අධි තොගයක් පවත්වා නොගැනිමට කටයුතු කළ යුතු වේ. | පිළිතුර ඉදිරියේදී ලබා දීමට කටයුතු කරමි. |
| **කළු ගල් ¾** මිටර් කියුබ් 1000 | - | අවු.01 | | |
| Dust මිටර් කියුබ් 1000 | - | අවු.01 | | |
| **ආ)** කොළඹ 14, මාදම්පිටිය, 350 | 42,880,634 | අවු.11 | වගකිව යුතු නිලධාරින් සම්බන්ධයෙන් පරීක්ෂණයක් | පිළිගනිමි. නව දෙමහල් |

| | | | | |
|---|---|---|---|---|
| වත්තේ උත්සව ශාලාව | | | පවත්වා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. ක්‍රීඩා හා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් උත්සව ශාලාව විවෘත කර මහජන අවශ්‍යතා සඳහා ලබාදීමට කටයුතු කළ යුතුවේ. | ගොඩනැගිල්ලේ බදු රහිත කොන්ත්‍රාත් මුදල වන්නේ රු.38,286,281.00 කි. එයට අනුව අයකර ගත යුතු මුළු ප්‍රමාද ගාස්තුව වන්නේ රු.3,828,628.10 ක් අය කර ඇති අතර නව ගොඩනැගිල්ල මේ වන විට වැඩ අවසන් කර ඇත. |
| ඇ)ගසේ ව්‍යුහය පරීක්ෂා කිරීමේ යන්ත්‍රය | 7,400,000 | අවු. 4 ½ | වගකිව යුතු නිලධාරීන්ට විරුද්ධව විනය පරීක්ෂණ පැවැත්විය යුතු අතර, උපයෝජනය සඳහා යොදාගත යුතුවේ. | මීට අදාල විගණන විමසුම සම්බන්ධයෙන් වන WNP$_2$/CB/D/CBD/CM/2017/16 සඳහා පිළිතුරු 2019 අප්‍රේල් 16 දින විගණකාධිපති වෙත යොමු කර ඇත. |
| ඇ)වැඩිහිටි නිවාසය සතු වාහන 02 ක් | - | වර්ෂ 05 කට වැඩි | අපහරනය කිරීමට කටයුතු කල යුතුවේ. | අංක 227-3013 හා GD-3083 අංක දරන වාහන දෙක වැඩිහිටි නිවාසයේ කටයුතු සඳහා යොදාගත් අතර, නිතර නිතර අළුත් වැඩියාවන් සිදුකිරීමට සිදුවීමත් එහි අළුත් වැඩියාවට විශාල මුදලක් වැය කිරීමට සිදුවීමත් නිසා භාවිතයෙන් ඉවත් කිරීමට තීරණය කර ඇත. මෙම වාහන වල අපහරණ කටයුතු සම්බන්ධව අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම අධ්‍යක්ෂ ඉංජිනේරු (නාගරික කර්මාන්තශාලාව) මඟින් සිදු කරමින් ඇත. |
| | | | මෙම නිවාස සංකීර්ණය පදිංචිකරුවන්ට හා අඩු ආදායම් ලාභී නිවාස නොමැති ජනතාවට ලබාදිමට කටයුතු කල යුතුය. | |

| | | | | |
|---|---|---|---|---|
| | | | මෙම කඩ බක්කි ඵලදායි කාර්යයකට යොදවා ගත යුතුවේ. | නිවාස 64 කින් සමන්විත මෙම නිවාස ව්‍යාපෘතිය මහා සභාවේ අනුමැතිය මත ඉදි කර ඇති අතර එහි නිවාස මෙම භූමියේ කඩා ඉවත් කළ අවස්ථාවේදී පදිංචි අයට හා කොළඹ නගරයේ අඩු ආදායම්ලාභී පවුල් වලට පැවරීමේ බලය සභාව සතු වේ. ඒ අනුව එම නිවාස ලබා දීම සඳහා කටයුතු සිදු කරමින් පවතී. |
| **ඉ)** කොළඹ 12 පැරඩයිස් පෙදෙසෙ පිහිටි ලොන්ඩරි භූමිය තුල ඉදිකර ඇති නිවාස 64 | 200,863,837 | අවු. 3 ට වැඩි | | නගර අලංකරණ වැඩ පිළිවෙල තුළ ක්‍රමවත් ආකාරයට පදික කඩ සංකීර්ණ තුල එකම ආකාරයට පදික වෙළඳුන් සඳහා ලබා දීමට බක්කි මිලදී ගත් නමුත් එම බක්කි ලබා ගැනීම වෙළඳුන් විසින් ප්‍රතික්ෂේප කල බැවින් ඵලදායි කාර්යයට යොදා ගත නොහැකි වුවත් එම කඩ බක්කි වෙනත් පොදු වෙළඳපොල අවශ්‍යතා මත යොදා ගැනීම සඳහා යෝජනා කර ඇත. |
| | | | අඩුපාඩු නිවැරදි කරවාගෙන භාවිතයට ගැනීමට කටයුතු කල යුතුවේ. | |
| **ඊ)** බක්කි කඩ 200 | 5,865,000 | අවු. 3 ට වැඩි | | පිළිතුරු ඉදිරියේදී ලබා දීමට කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| උ) 2018 අප්‍රේල් 18 දින මිලදීගෙන සතුටු උයන පරිශ්‍රයේ සවිකර ඇති ළමා ක්‍රීඩා උපකරණ. | 27,237,359 | අවු. 01 |

**3.5.2 වත්කම් වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

-------------------------------------------

| | | | |
|---|---|---|---|
| (අ) | ඉහළ වෙළඳපල වටිනාකමක් ඇති දේපළ 16 ක් වර්තමානයේ භුක්ති විඳින පාර්ශව පිළිබඳ සභාව දැනුවත්ව නොතිබූ අතර අනවසර අත්පත් කර ගැනීම් සම්බන්ධයෙන්ද විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අනවසර අත්පත් කර ගැනීම් සම්බන්ධයෙන් සභාව විසින් විධිමත් පියවර ගත යුතුවේ. | පිළිතුරු ඉදිරියේදී ලබා දීමට කටයුතු කරමි. |
| (ආ) | මෝදර Elie House ඉඩමෙන් පර්චස් 50 ක් 1992 ජූලි මස සෑමට සරණ ආයතනයට බදු දී තිබූ අතර එම ඉඩමෙහි ඉතිරි පර්චස් 60 හි අනවසර ඉදිකිරීම් කර සෑමට සරණ ආයතනය විසින් භාවිතා කරමින් තිබුණි. | අනවසර අත්පත් කර ගැනීම් හා ඉදිකිරීම් සම්බන්ධයෙන් සභාව විසින් නීතිමය කටයුතු කල යුතුවේ. | සභාවට අයත් මෝදර එළි හවුස් ඉඩමෙන් පර්චස් 50ක් 1992 ජූලි මස සෑමට සරණ ආයතනයට බදු දී ඇති අතර එම ඉඩමෙහි ඉතිරි පර්චස් 60 ක ප්‍රමාණයක් අනවසරයෙන් එම ආයතනය විසින් තම කටයුතු සඳහා භාවිතා කරති. ආයතනය විසින් භුක්ති විඳිනු ලබන එම ඉතිරි ඉඩම් ප්‍රමාණය සඳහා 1992 වර්ෂයේ සිට හිඟ මුදල් අය කර ගැනීමට යටත්ව කල්බදු ක්‍රමයට ලබා දීමට සභාව වෙත යෝජනා කෙටුම්පතක් ඉදිරිපත් කිරීමට පියවර ගෙන ඇත. |

**3.5.3 කල් ඉකුත් වූ තොග**

---------------------

| | | |
|---|---|---|
| කල් ඉකුත් වූ රු.3,685,125 ක තර්මෝ ප්ලාස්ටික් කි.ග්‍රෑ.22975ක ප්‍රමාණයක් ගබඩාවල රඳවා තිබූ අතර මෙම තොගයෙන් කි.ග්‍රෑ.10000 ක් 2016 වර්ෂයේදී මිලදී ගන්නා අවස්ථාවේදීම කල් ඉකුත් වී තිබුණි. | විධිමත් පරීක්ෂණයක් වගකිව යුතු නිළධාරීන් සම්බන්ධයෙන් සිදුකිරීම සහ මුදල් රෙගලාසි ප්‍රකාර පාඩුව අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | පිළිතුරු ඉදිරියේදී ලබා දීමට කටයුතු කරමි. |

**3.6** වාහන උපයෝජනය
-----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂයේ අයවැය මගින් නාගරික කර්මාන්ත ශාලාවේ ඉලෙක්ට්‍රිකල් අංශයට ස්නෝකල් රථ 02 ක් මිලදී ගැනීම සඳහා මුදල් ප්‍රතිපාදන ලබාදී තිබු නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් මිලදී ගැනීම් සිදු කර නොතිබුණු අතර 2018 වර්ෂයේදි ස්නෝකල් රථ 03 ක් කුලියට ගෙන ඒ සඳහා රු.6,477,641 ක් ගෙවා තිබුණි. | මිලදි ගැනීම් අතපසු කිරීම් සම්බන්ධයෙන් ඉහල කළමනාකරණයේ අවධානය යොමු කල යුතුවේ. | මිල ගණන් කැඳවන අවස්ථාවේදී සැපයුම්කරුවන් විසින් ඉල්ලා ඇති පිරිවිතර වලට එකඟතාවය දක්වා ඇති නමුත්, සපයා ඇති යන්ත්‍ර වල වෙනස්කම් කිහිපයක් තිබූ බැවින් තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් නිර්දේශ ලබා දීම ප්‍රමාද වී තිබුණි. |
| (ආ) | නාගරික කර්මාන්ත ශාලාව සතු වාහන 44 ක් සහ යන්ත්‍රෝපකරණ 20 ක ප්‍රමාණයක් සඳහා 2018 වර්ෂයේදි රු.7,324,822 ක ඉන්ධන ලබාදී තිබු නමුත් එම වාහන හා යන්ත්‍ර උපකරණවල ධාවන සටහන්/ වාර්තා සකස් කර නොතිබුණි. | දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශය නියමිත පරිදි විගණනයට ඉදිරිපත් කල යුතුවේ. | දැනට නාගරික කර්මාන්තශාලාවේ භාවිතා කරනු ලබන වාහන හා යන්ත්‍ර වලින් කිහිපයක් සඳහා පමණක් ධාවන සටහන්පත් ලිවීම රියදුරන් විසින් ඉටු කරන අතර ඒවායෙන් ද සමහරක් අක්‍රමවත් අන්දමින් පවත්වාගෙන යන බවට විගණන විමසුමෙහි දක්වා ඇති කරුණු නිවැරදිය. |
| (ඇ) | 2018 මුල් අර්ධ වර්ෂය තුල අංශ 13 ක වාහන සඳහා රු.62,459,278 ක් වටිනා ඉන්ධන නිකුත් කර තිබු නමුත් එම වාහන වල ධාවන සටහන් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ නියමිත පරිදි විගණනයට ඉදිරිපත් කල යුතුවේ. | පිළිතුරු ඉදිරියේදී ලබා දීමට කටයුතු කරමි. |
| (ඈ) | ඉන්ධන නිකුත් කිරිමේ ලේඛන අනුව 2018 වර්ෂයේ මුල් අර්ධ වර්ෂය තුල අංශ 20 ක ඇති වාහන 303 ක් සඳහා ඉන්ධන නිකුත් කර නොතිබුණි. | මෙම වාහන ඵලදායිව යෙදවීමට කටයුතු කල යුතුවේ. | පිළිතුරු ඉදිරියේදී ලබා දීමට කටයුතු කරමි. |
| (ඉ) | පෙර මිශ්‍ර අංගනය සතු භාවිතයට නොගන්නා වාහන හා උපකරණ 50 ක් දීර්ඝ කාලයක සිට ස්වාභාවික ආපදාවන්ට ලක් වෙමින් පැවති අතර ඒවා අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කල යුතුවේ. | පිළිතුරු ඉදිරියේදී ලබා දීමට කටයුතු කරමි. |

## 3.7 අවිධිමත් ගනුදෙනු

--------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීයාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 1987 සැප්තැම්බර් 30 දිනැති අංක 08 දරන නාගරික සංවර්ධන අධිකාරියේ චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය නියෝජිත ගිණුම වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන විශේෂ බැංකු ගිණුමෙන් මුදල් ආපසු ලබාගත හැකි වන්නේ නගර සභාව විසින් හඳුනාගත් සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා පමණක් වුවද එවැනි ව්‍යපෘති හඳුනාගැනීමකින් තොරව එකතුව රු.877,355,187 ක මුදල් ආපසු ලබාගෙන තිබුණි. | අනුමත කල හඳුනාගත් ව්‍යාපෘතින් ක්‍රියාත්මක කල යුතුවේ. | ඉහත විශේෂ බැංකු ගිණුමට ලැබෙන සැලසුම් කමිටු ආදායම විශේෂ නියෝජිත ගිණුමට ඇතුලත්ව ඇති අතර අනෙකුත් ලැබීම් (VAT, අනෙකුත් බදු) ආපසු ප්‍රධාන ගෙවීම් ගිණුමට මාරු කර ඇත. එසේම ජංගම ගිණුමේ අක්‍රීයව පවතින මුදල් ආයෝජන කර ඒ තුලින් නගර සභාවට ආදායමක් උපයා ගෙන ඇත. |
| (ආ) | නාගරික කර්මාන්ත ශාලාවේ නියැදි පරීක්ෂාවේදී නිලධාරින් 10 දෙනෙකුට නිවාඩු දින දීමනා ගෙවීමේදී ඇඟිලි සලකුණු මුද්‍රිතයට අනුව පැමිණීම හා පිටවීම එකම වේලාව සටහන් වූ දිනයන් 68 ක් සඳහා රු.255,669 ක් ගෙවා තිබුණි. | ගෙවීම් සඳහා නිවැරදි සනාථ කිරීම් තිබිය යුතුවේ. | 2019 වර්ෂයේ සිට බැහැර යාම සඳහා අනිවාර්යයෙන්ම බැහැර යාමේ ලේඛණයේ සතියේ දිනවලදී පමණක් නොව සෙනසුරාදා හා නිවාඩු දින වලදී ද සටහන් කොට බැහැර යා යුතු බවට උපදෙස් ලබා දී ඇත. |
| ඇ) | 2018 වර්ෂයේ දෙසැම්බර් මස නාගරික කර්මාන්ත ශාලාවේ නිලධාරීන් 15 දෙනෙකුගේ අතිකාල ගෙවීම් නියැදියක් පරීක්ෂා කිරීමේදී ඇඟිලි සළකුණු යන්ත්‍රය අනුව අතිකාල පැය ගණන පැය 74 ක් වුවත් අතිකාල ගෙවීම සඳහා භාවිත කර තිබූ කාලය පැය 2900 ක් විය. මේ අනුව ඇඟිලි සළකුණු යන්ත්‍රයේ සටහන් නොවූ අමතර අතිකාල පැය 2826 ක් සමගින් මුළු පැය 2900 සඳහා රු.309,104 ක් ගෙවා තිබුණි. | ඇගයීම් සඳහා නිවැරදි සනාථ කිරීම් තිබිය යුතුවේ. | කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස් 2015.09.29 දිනැති අංක නාලේ/චක්‍රලේඛ/20/2015 දරන අභ්‍යන්තර චක්‍රලේඛය ප්‍රකාරව කේෂ්ත්‍ර නිලධාරින් හා කේෂ්ත්‍ර රාජකාර වල නියැලෙන සේවකයින්ගේ පැමිණීම, පිටවීම සම්බන්ධයෙන් උපදෙස් ලබාදී ඇති චක්‍රලේඛයේ 03 ඡේදය පරිදි කටයුතු කිරීම නිසා ඇඟිලි සළකුණු යන්ත්‍රය මඟින් සටහන්වන අතිකාල පැය ගණනත් කරනු ලබන අතිකාල පැය |

| | | |
|---|---|---|
| | | ගණනත් අතර වෙනසක් ඇති බව කාරුණිකව පෙන්වා දෙමි. |

## 3.8 ප්‍රසම්පාදනය

### 3.8.1 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීයාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අ) 2015 වර්ෂයේ ටෙන්ඩර් කැඳවා පෙර මිශ්‍රණ අංගනය සඳහා තෙමහල් කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරිම සඳහා රු.37,121,963 ක වැට් රහිත මුදලකට 2016 පෙබරවාරි 09 දින ගිවිසුම්ගත වි තිබු අතර 2016 ඔක්තෝබර් 26 දින ඉදිකිරිම් නිමකල යුතු වුවත්, අවස්ථා 4ක දී කාලය දීර්ඝ කර තිබුනි. මෙහිදි කාලය දීර්ඝ කිරිම් අනුමත කර තිබුණේ දීර්ඝ කල දිනය පසුවී සැලකිය යුතු කාල ප්‍රමාදයකින් පසුවය. තවද ප්‍රමාද ගාස්තු අයකිරිම වෙනුවට නියෝජ්‍ය නාගරික කොමසාරිස් (ඉංජිනේරු සේවා) හා ව්‍යාපෘති ඉංජිනේරු වරයාගේ අභිමතය පරිදි කාලය දිර්ඝ කර තිබු අතර සභාවට අහිමි වු ප්‍රමාද ගාස්තුව රු.3,712,196 ක් විය. කාලය දීර්ඝ කිරීමේදී කාර්යසාධන ඇප බැඳුම්කරයේ කාලය දීර්ඝ කර නොතිබුණි. | දින දීර්ඝ කිරීම් සාධාරණ හේතු මත සිදුකළ යුතු අතර, නැතහොත් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | ඉදිරියේද සියළුම ඉදිකිරිම් සම්බන්ධයෙන් ඇති සැලසුම් වල වෙනස්කම් අදාල ගොනුවට සටහන් කිරිමට කටයුතු කිරිමට නිලධාරින් දැනුවත් කිරිමට පියවර ගෙන ඇත. කොන්ත්‍රාත් කොන්දේසි ප්‍රකාර වැඩබිමේ ඇති වන ප්‍රමාදයන් පදනම් කරගෙන කාල දිගුවක් අනුමත කිරීමේ බලය ඉංජිනේරුවරයා සතුව පවති. ප්‍රමාද ගාස්තු අය නොකළද කොන්ත්‍රාත් මුදල වැඩි කිරීමට කටයුතු නොකිරීමෙන් සභාවට වාසි සහගත තත්වයක් උදාකර ඇත. කාලය දීර්ඝ කිරීමට අනුව කාර්ය සාධන බැඳුම්කරයේ කාලයද සංශෝධනය කරන ලෙස බොහෝ කොන්ත්‍රාත්කරුවන්ට දැනුම්දීම කලද කාර්ය සාධන බැඳුම්කරයේ කාලය දීර්ඝ නොකරන අවස්ථා දක්නට ලැබේ. |
| (ආ) **(i)** පෙර මිශ්‍රණ අංගනය සඳහා CCTV පද්ධතියක් සවි කිරිම සඳහා තෝරාගත් සැපයුම්කරුට රු.1,052,000 ක් 2015 පෙබරවාරි 16 දින ගෙවා තිබු නමුත් නඩත්තු හා අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් නඩත්තු ගිවිසුමකට එළඹ නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කළයුතු වේ. | කැමරා සවිකල ආයතනය විසින් ඒ සඳහා වන වගකීම් කාලයේදී ඇති වු දෝෂ සහගත තත්වයන් වලදී ඒ සම්බන්ධයෙන් කොතරම් දැනුවත් කළද එම දෝෂ සහගත තත්වයන් නිවැරදි කිරීමට කටයුතු නොකළ බැවින් එම ආයතනය සමඟ නඩත්තු ගිවිසුමකට නොඑළඹුණු අතර නගර |

| | | |
|---|---|---|
| | | සභාවේ සේවක මහතුන් ලවා නඩත්තු කටයුතු සිදු කරන ලදී. |
| **(ii)** 2018 වර්ෂයේ නොවැම්බර් මස වන විට පෙර මිශ්‍රණ අංගනයේ කැමරා 16 න් 05 ක් පමණක් ක්‍රියාත්මකව තිබූ අතර කැමරා 11 ක් ගලවා ඉවත් තිබුණි. | සම්පත් ඵලදායීව කාර්යක්ෂමව භාවිතයට නොගත් නිසා වගකිව යුතු නිලධාරීන්ගෙන් කරුණු විමසිය යුතුවේ. | විගණන අවස්ථාවේ කැමරා 05 ක් පමණ ක්‍රියාත්මක වූ අතර ගලවා දමා තිබුණේ කැමරා 08 ක් පමණි. ඉතිරි කැමරා 03 පරිශ්‍රයේ ස්ථානගත කල ස්ථාන වල පැවතුනි. |

**4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**
----------------------------------------

**4.1** අයවැය පාලනය
------------------

| | | |
|---|---|---|
| රු.100,000 ට වැඩි ආදායමක් අපේක්ෂිත රු.886,400,000 ක ඇස්තමේන්තු වටිනාකමක් ගත් අය විෂයයන් 47 කින් කිසිදු ආදායමක් උපයා නොතිබුණි. ඒ තුල අපජල අංශයට අයත් අය විෂයයන් 31 ක් ඇතුලත් වී තිබූ අතර මුළු වටිනාකමින් එය සියයට 83 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. | නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවේ. | වර්ෂය තුල උපයාගත යුතු ආදායම ආසන්නව ඇස්තමේන්තු කරනු ලබන අතර මෙම වටිනාකම් නිශ්චිතවම පුරෝකථනය කිරීම අපහසුවේ. ඇතැම් ආදායම් උපයා ගැනීමේ අපෙක්ෂාවෙන් අයවැයට ඇතුලත් කරනු ලැබුවත් විවිධ ගැටළු නිසා එම ආදායම් එකතු කර ගැනීමට නොහැකි වී ඇත. |

**4.2 පිළිතුරු නොලත් විගණන විමසුම්**
--------------------------------------

| <u>**විගණන නිරීක්ෂණය**</u> | <u>**නිර්දේශය**</u> | <u>**ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම**</u> |
|---|---|---|
| 2018 වර්ෂයේදි නිකුත් කල ගණනය කළ හැකිව තිබූ වටිනාකම රු.167,521,046 ක් වූ විගණන විමසුම් 12 ක් සඳහා පිළිතුරු ලැබී නොතිබුණි. | විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු සැපයීමට කටයුතු කල යුතුවේ. | ඉදිරියේදී පිළිතුරු සැපයීමට කටයුතු කරමි. |

**4.3 පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභා රැස්වීම් නියෝග**
------------------------------------------------------

| <u>**විගණන නිරීක්ෂණය**</u> | <u>**නිර්දේශය**</u> | <u>**ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම**</u> |
|---|---|---|
| පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභා රැස්වීම් වලදී ලබා දුන් නියෝග අටක් 2018 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | පළාත් ගිණුම් කාරක සභා නියෝග ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. |